# 7.3 - රංග උපකරණයක් නිර්මාණය කරමු.

නිපුණතා මට්ටම -: සරල රංග උපකරණයක් නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම -: රංග උපකරණයක් නිර්මාණය කරමු

හැඳින්වීම -: කිසියම් නර්තන ක්‍රියාකාරකමකදී ඒ සඳහා අනිවාර්යයෙන්ම අවශ්‍යවන කවර හෝ උපකරණයක් රංග උපකරණයක් ලෙස හැඳින්විය හැක.රංග උපකරණයක් සැබෑ උපකරණයක් නොවේ.එය නර්තනයකදී එහි අවශ්‍යතාවය මත යොදා ගන්නා කලාත්මක උපකරණයකි.

උදා -:

- කුලු නැටුමේදී - කුල්ල
- ලී කළි නැටුමේදී - ලී
- සවරං නැටුමේදී - සවරම
- මෝල්ගස් නැටුමේදී - මෝල්ගස
- කළගෙඩි නැටුමේදී - කළය
- ගොයම් නැටුමේදී - දෑකැත්ත
- චාමර නැටුමේදී - චාමරය
- කඩු නැටුමේදී - කඩුව

- **රංග උපකරණ භාවිත කරන්නේ ගැමි නැටුම් වලදී පමණක්ම නොවේ. ශාන්තිකර්ම වලදී ද රංග උපකරණ භාවිත කරයි.**


රංග උපකරණයක තිබිය යුතු ගුණාංග මෙලෙස හඳුනාගත හැකිය.

- එය රංග කාර්ය සඳහා යොදා ගත යුතු අත්‍යවශ්‍ය උපකරණයක් විය යුතුය.
- එය රංග කාර්යයේදී භාවිත කළ හැකි විය යුතුය.
- ණිර්මාණාත්මක එකක් විය යුතුය.
- ශක්තිමත් විය යුතුය.
- කලාත්මක විය යුතුය.
- එමඟින් නර්තන නිර්මාණයට ආකර්ශනීය සුන්දරත්වයක් ලැබිය යුතුය.

අපි දැන් බලමු කොහොමද රංග උපකරණ නිර්මාණය කරන්නේ කියල.

කුල්ල නිර්මාණය කිරීම - බොහෝ විට කාන්තාවන් පරිහරණය කරන උපකරණයක් ලෙස කුල්ල හැඳින්විය හැක.කුල්ලෙහි ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් අමුද්‍රව්‍ය සපයා ගත හැකිය.





යොදා ගත හැකි අමුද්‍රව්‍ය

- කොළපත්
- කාඩ්බෝඩ්
- බ්‍රිස්ටල්බෝඩ්
- වර්ණ කඩදාසි

පියවර 1 -: කුල්ල නතිර්මාණය කිරීමට අවශ්‍ය වන අමුද්‍රව්‍ය තීරණය කිරීම හා ඒවා සොයා ගැනීම

පියවර 2 -: උපකරණය සෑදීම සඳහා ආකෘතිය නිර්මාණය කිරීම ( උස හා දිග / වට ප්‍රමාණය / පරිමාව / හැඩය / කැපීම් යොදන ස්ථාන )


පියවර 3 -: අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන සකස් කළ ආකෘතියට අනුව රංග උපකරණය නිර්මාණය කිරීම.

ක්‍රියාකාරකම 1

1. රංග උපකරණයක් නිර්මාණය කිරීම සඳහා යොදා ගත හැකි අමුද්‍රව්‍ය නම් කරන්න.
2. මූලික සැලැස්ම සකස් කළ අයුරු විස්තර කරන්න
3. රංග උපකරණය නිර්මාණය කළ ආකාරය හා එහි සාර්ථකත්වය පැහැදිලි කරන්න.

**දෑකැත්ත** නිර්මාණය **කිරීම -** දෑකැත්ත ගොයම් කැපීම සඳහා යොදා ගන්නා උපකරණයක් බව ඔබ දැනටමත් දන්නවා ඇති.මේ සඳහා යොදා ගත හැකි





අමුද්‍රව්‍ය ලෙස

- කාඩ්බෝඩ්
- හාඩ්බෝඩ්
- බෙලෙක් තහඩු
- ලී මිටක්
- වර්ණ කඩදාසි

පියවර 1 -: ඍි කැත්ත නර්මාණය කිරීමට අවශ්‍ය තීරණය කිරීම.

පියවර 2 -: දෑකැත්ත නිර්මාණය කිරීම සඳහා සැලැස්ම සකස් කිරීම.

පියවර 3 -: අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන අදින ලද ආකෘතිය අනුව දෑකැත්ත නිමාණය කිරීම.

ක්‍රියාකාරකම 2


1 . දෑකැත්ත නිර්මාණය කිරීම සඳහා සුදුසු අමුද්‍රව්‍ය නම් කරන්න.

2 . මූලික සැකැස්ම සකස් කළ අයුරු විස්තර කරන්න.

3 . උපකරණය නිර්මාණය කළ අයුරු පැහැදිලි කරන්න.

මෝල්ගස නිර්මාණය කිරීම - මෝල්ගස භාවිත කරන්නේ වී ඇතුලු ධාන්‍ය වර්ග කෙටීම සඳහාය.මෝල්ගසක් නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය ලෙස මේවා හඳුනාගත හැක.



අමුද්‍රව්‍ය ලෙස

**රෙදි ඔතන බම්බු**

**එස්ලෝන් බට**

**වර්ණ කඩදාසි**

පියවර 1 -: මෝල්ගස නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය තීරණය කිරීම.

පියවර 2 -: මෙය නිර්මාණය කිරීම සඳහා ආකෘතිය සැකසීම.

පියවර 3 -: රංග උපකරණය නිර්මාණය.

ක්‍රියාකාරකම 3

1 . මෝල්ගස නිර්මාණය කිරීම සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය නම් කරන්න.

2 . එය නිර්මාණය කළ අයුරු විස්තර කරන්න.

3 . ඔබ නිර්මාණය කළ රංග උපකරණ වල රූප සටහන් අඳින්න.

සැකසුම - **H. S. V. S. H. දංගොල්ල බණ්ඩාර ර/ නිවි/** පැබොටුව මහා **විද්‍යාලය** පැබොටුව